# කාන්තා ප්‍රතිරූපය නිරූපණය වීම කෙරෙහි විලාසිතා බලපාන ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්


Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එම්. එම්. ජේ. එන්. කුමාරි* [1]**



සංක්ෂේපය

අද ලෝකය පුරාම විලාසිතා යන සංකල්පයට මුල් තැනක් ලබා දෙන අතර එය රටින් රටට, කලාපයෙන් කලාපයට විවිධ දේශගුණික තත්ත්වයන් හා සංස්කෘතීන් අනුව වෙනසක් දැකිය හැකිය. මෙම විලාසිතාවන් පුද්ගලයන්ගේ ජීවිතය හා බැඳි පවතින අතර එය කාන්තාවන්ට විශේෂ වන අතර ඔවුන් සමාජය තුළ නිරූපණය කරන ප්‍රතිරූපය හා සම්බන්ධ වේ. පුද්ගලයින් විවිධ සමාජ අවස්ථාවන් තුළ විවිධ සමාජ භූමිකාවන් නිරූපණය කරනු ලබන අතර එම අවස්ථාවන් නිරූපණය කිරීමට විලාසිතා හරහා ලැබෙනුයේ මහත් පිටුවහලකි. පුද්ගලයෙකු දැක ගැනීමට හැකි වූ පමණින්ම ඇය හෝ ඔහුගේ වෘත්තිය, ඔහු ළමයෙකුද, සිසුවෙකුද? එසේත් නැතිනම් වෙනත් ක්ෂේත්‍රයක් නිරූපණය කරන්නෙකුද යන්න අවබෝධ කරගැනීමට විලාසිතා වැදගත් වේ. නමුත් සමාජය තුළ ජීවත්වන පුද්ගලයින්ට තම අපේක්ෂිත ප්‍රතිරූපය සමාජය තුළ නිරූපණය කිරීමට නොහැකි වූ අවස්ථාවන්හිදී විලාසිතා හා බැඳුණු කාන්තා ප්‍රතිරූපය බිඳ වැටෙන ආකාරයක් දැකිය හැකිය. මෙය සමාජය තුළ පවතින අර්බුදකාරී තත්ත්වයක් වන බැවින් එය අධ්‍යයනය කිරීම සිදු කෙරිණි.

මෙම නිබන්ධය සඳහා නිබන්ධ ගැටලුව වශයෙන් තොරා ගත්තේ. "කාන්තාවන් විලාසිතා අනුකරණය කිරීමෙන් ලැබෙන සමාජ ප්‍රතිරූපය කුමන ස්වභාවයක් ගන්නේද?" යන්න සෙවීමය. මෙවන් ගැටළුවක් මුල්කොටගෙන අධ්‍යයනය කිරීම තුළින් බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණ වනුයේ විලාසිතා හරහා කාන්තා ප්‍රතිරූපය වෙනස් වන ආකාරය සෙවීමය. මෙය අධ්‍යයනය කිරීමට යොදාගත් අධ්‍යයන ක්ෂේත්‍රය වන්නේ කැලණිය විශ්ව විද්‍යාලයයි.

මෙය ප්‍රමාණාත්මක අධ්‍යයනයක් වන අතර දත්ත රැස්කිරීම සඳහා සමීක්ෂණ ක්‍රමය යොදාගත් අතර සිසුන් 100 දෙනෙකුගෙන් යුත් නියදියක් තෝරාගෙන ප්‍රශ්නාවලී ලබා දීමෙන් ප්‍රාථමික දත්ත රැස්කරගනු ලැබූ අතර ශාස්ත්‍රීය ලිපි, සඟරා නිබන්ධන හරහා ද්විතීක දත්ත රැස්කරගනු ලැබීය. මෙම අධ්‍යයනය හරහා අවසාන වශයෙන් එළඹෙන නිගමනය වනුයේ විලාසිතා පුද්ගලයින්ට අත්‍යවශ්‍ය දෙයක් වන අතර පුද්ගලයන් තම රුචිකත්වයට අනුව විලාසිතාවන් අනුකරණය කළද පවතින සමාජ වටපිටාව අනුව එය තමන්ට ගැළපෙන ආකාරයට අනුකරණය කළ යුතුය. එසේ නොවුණහොත් පුද්ගලයා හා බැඳුණු සමාජීය ප්‍රතිරූපය නිසියාකාරව සමාජය තුළ ප්‍රදර්ශනය කළ නොහැකිය.



ප්‍රමුඛ පද :කාන්තා ප්‍රතිරූපය, විලාසිතා, ශ්‍රී ලංකාව



*1 සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*